# ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
# බදුල්ල
# ටෙන්ඩර් පත්‍රිකාව

**ටෙන්ඩර් අංකය- UWU/GA/05/V/25/01**

**01.** මෝටර් කාර් රථ සෙඩාන් හෝ SUV මාදිළිය (1490 සීසී-1600සීසී/පෙට්‍රල් /වායු සමනය සහිත/ ජපන්/යුරෝපීය තාක්ෂණය හෝ සමාන/ පීඨාධිපතිතුමාගේ පරිහරණය සඳහා) - 01

**ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය**
**බදුල්ල**
**ටෙන්ඩර් පත්‍රිකාව**

**ටෙන්ඩර් අංකය - UWU/GA/05/V/25/01**

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ භාවිතය සදහා මාසික කුලී පදනම මත වසර 03 ක් සදහා වාහන ලබා ගැනීම.(අවුරුද්දක කාල සීමාවෙන් පසු සාර්ථක සේවා සපයන්නන් සදහා බදු කාල සීමාවෙන් පසු සාර්ථක සේවා සපයන්නන් සදහා බදු කාල සීමාව දීර්ඝ කිරීමට සලකා බලනු ලැබේ)

**01.** මෝටර් කාර් රථ සෙඩාන් හෝ SUV මාදිලිය (1490 සීසී-1600සීසී/පෙට්‍රල් /වායු සමනය සහිත ජපන්/යුරෝපීය තාක්ෂණය හෝ සමාන/ පීඨාධිපතිතුමාගේ පරිහරණය සදහා) - 01

ටෙන්ඩරය අවසන් වන දිනය හා වේලාව - දින 2025.01.21 ප.ව 2.30 ට

සභාපති
ප්‍රසම්පාදන කමිටුව
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
බදුල්ල

ටෙන්ඩර් අංකය **UWU/GA/05/V/25/01**
රිසිට් අංකය ..............................................
නිකුත් කිරීමේ නිලධාරියාගේ අත්සන ......................
දිනය .....................................................
මුද්‍රාව ............................................

විමසීම් - නියෝජ්‍ය ලේඛකාධිකාරි (සාමාන්‍ය පාලන)
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
බදුල්ල
055-2226470

**ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය**
**බදුල්ල**
**ටෙන්ඩර් අංකය- UWU/GA/05/V/25/01**

**ටෙන්ඩරය සඳහා වන කොන්දේසි**

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත දක්වා ඇති කොන්දේසි යටතේ මාසික කුලී පදනම මත වසර 03 ක් සඳහා වාහන ලබා ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ.(අවුරුද්දක කාල සීමාවෙන් පසු සාර්ථක සේවා සපයන්නන් සඳහා බදු කාල සීමාව දීර්ඝ කිරීමට සලකා බලනු ලැබේ)

01.ටෙන්ඩර් ප්‍රදානය කරනු ලබන දින සිට අවුරුදු 03 ක කාල සීමාවක් සඳහා පහත සඳහන් වාහන සැපයිය හැකි ආයතන වලින්/ පුද්ගලයින් වෙතින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.(අවුරුද්දක කාල සීමාවෙන් පසු සාර්ථක සේවා සපයන්නන් සඳහා බදු කාල සීමාවෙන් පසු සාර්ථක සේවා සපයන්නන් සඳහා බදු කාල සීමාව දීර්ඝ කිරීමට සලකා බලනු ලැබේ)

**01.** මෝටර් කාර් රථ සෙඩාන් හෝ SUV මාදිලිය (1490 සීසී-1600සීසී/පෙට්‍රල් /වායු සමනය සහිත/ ජපන්/යුරෝපීය තාක්ෂණය හෝ සමාන/ පීඨාධිපතිතුමාගේ පරිහරණය සඳහා) - 01

02. ඉදිරිපත් කරන මිළගණන් ටෙන්ඩරය විවෘත කරන දින සිට දින 90ක් දක්වා වලංගු විය යුතුය.

03. ටෙන්ඩරය සඳහා ඉදිරිපත් කරනු ලබන වාහනය අලුත්ම වාහනයක් හෝ ලියාපදිංචි නොකල වාහනයක් නම් එය සනාථ කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි වල සහතික කරන ලද පිටපත් (උදා- ලියාපදිංචි සහතිකය) ටෙන්ඩර් පත සමග ඉදිරිපත් කල යුතුය.

04. ටෙන්ඩරය මගින් ඉදිරිපත් කරනු ලබන වාහනය ඉතා හොඳ ධාවන තත්වයෙන් තිබිය යුතු අතර එහි ප්‍රථම ලියාපදිංචිය 2015 වර්ෂයේ හෝ ඊට පසු විය යුතුය.. එසේම නිෂ්පාදිත වර්ෂය 2015 වර්ෂයේ හෝ ඊට පසු විය යුතුය. එය සනාථ කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි වල පිටපත් (උදා - ලියාපදිංචි සහතිකය) ටෙන්ඩර් පත සමග ඉදිරිපත් කල යුතුය. ටෙන්ඩර් ඇගයීමේදී මිල ගණන් වලට අමතරව වාහනයේ නිෂ්පාදිත වර්ෂය, ලියාපදිංචි වර්ෂය, තත්වය, ධාවනය කර ඇති කිලෝමීටර ගණන සහ නඩත්තු සේවා සහතික ආදිය සලකා බලනු ලැබේ. <u>නියමිත වාහන ප්‍රමාණයක් නොලැබූ විටදී ඉහත කොන්දේසි වලට පරිබාහිරව වාහන තෝරාගනු ලැබේ</u>.

05. ලියාපදිංචි කල වාහනයක් ටෙන්ඩරය සඳහා ඉදිරිපත් කරනු ලබන්නේ නම් වාහනය ටෙන්ඩර්කරුගේ නමට ලියාපදිංචි වී තිබිය යුතු අතර යම් ආයතනයක් මගින් ටෙන්ඩර් ඉදිරිපත් කරන්නේ නම් එම ආයතනය හා වාහන හිමිකරු අතර නෛතික බැඳීමක් තිබිය යුතු අතර එය සනාථ කිරීම සඳහා නෛතික ගිවිසුමේ පිටපතක් (ඇටෝර්නි බලපත්‍රය) ඉදිරිපත් කළ යුතුය.

06. සියලුම වාහන සඳහා වන ටෙන්ඩර්පත් ආපසු ගෙවන රු 27,000.00 ක් වටිනා ලංසු ඇපකරයක් සමග ඉදිරිපත් කල යුතුය. ලංසු ඇපකරය විශ්වවිද්‍යාලයේ සරප් වෙත රු 27,000.00 ක් ගෙවා ලබාගත් ලදුපත (මුල් පිටපත) මගින් හෝ පිළිගත් බැංකුවකින් ලබාගත් ටෙන්ඩර් විවෘත කරන දින සිට දින 120ක් දක්වා වලංගු රු 27,000.00ක් වටිනා බැදුම්කරයක් මගින් ඉදිරිපත් කළ යුතුය.(එසේ නොමැති ටෙන්ඩර්පත් සියල්ල ප්‍රතික්ෂේප කරනු ලැබේ.) ටෙන්ඩරය

සඳහා ඉදිරිපත් කරනු ලබන වාහනය විශ්වවිද්‍යාලය මගින් ඉල්ලුම් කල විට එය සැපයීමට අපොහොසත් වුවහොත් මෙම මුදල නැවත ගෙවනු නොලැබේ.

07. වාහනයට අදාල රක්ෂණය පූර්ණ රක්ෂණයක් විය යුතු අතර කුලී ධාවනය සඳහා මෙන්ම මගීන් සඳහාද රක්ෂණ ආවරණ ලබා තිබිය යුතුය. පිළිගත් ටෙන්ඩර්කරු විසින් වාහනය විශ්වවිද්‍යාලය වෙත භාරදීමේදී අදාල පරිදි රක්ෂණ සහතික ඉදිරිපත් කල යුතු වේ.ඉදිරි වර්ෂයන් සඳහා රක්ෂණ ආවරණ ලබා ගැනීමද ටෙන්ඩර්කරු විසින් සිදු කළ යුතුය. තවද, රියදුරු නොමැති අවස්ථාවකදී අදාළ නිළධාරියාට (වලංගු රියදුරු බලපත්‍රයක් සහිත) වාහනය ධාවනය කිරීමට හැකියාව පවතින අතර අදාළ ටෙන්ඩර්කරු වාහන රක්ෂණ සහතිකය ලබාගැනීමේදී එම අවස්ථාව ආවරණය වන පරිදි රක්ෂණ ආවරණය ලබා ගැනීමට ද කටයුතු කළ යුතුය.

08. වාහනය දවසේ පැය 24 තුලදීම විශ්වවිද්‍යාලය භාරයේ තැබිය යුතු අතර කිසිම අවස්ථාවක අනුමැතියකින් තොරව ඉන් බැහැර ගෙන යාමට අවසර නොමැත. කෙසේ වෙතත් වාහන භාර නිලධාරියාගේ අනුමැතිය මත වාහනය නිදහස් කර ගත හැක.ඒ සඳහා ඔබ විසින් භාවිතා කල දුර ප්‍රමාණය මාසික බිල්පතෙන් අඩු කරනු ලැබේ. එසේ නොමැතිව සේවයෙන් ඉවත්කර ගන්නා සෑම දිනක් සඳහාම සඳහා රු 7,000.00 මුදලක් මාසික කුලියෙන් අඩු කරනු ලැබේ.

09. අදාල වාහන විශ්වවිද්‍යාල සේවය සඳහා පැය 24 පුරාවටම ලබා දිය යුතු අතර ඒ සඳහා සුදුසු රියදුරන් යෙදවීම වාහන හිමිකරුගේ වගකීමක් වේ. රියදුරු සඳහා කිසිම වේතනයක් විශ්වවිද්‍යාලය මගින් නොදරන අතර සේවක අර්ථසාධක සේවක භාරකාර අරමුදල්, රියදුරු සඳහා මූලික ගෙවීම කම්කරු නීතිවලට අදාලව ගෙවිය යුතුය.. වාහන නඩත්තු **(Service)** කටයුතුද ඒ සඳහා සියලු වියදම් වාහන හිමිකරු විසින්ම සිදුකල යුතුය. නවාතැන්ගන්නා රියදුරන් සඳහා නවාතැන් පහසුකම් විශ්වවිද්‍යාලය මගින් සපයනු ලබන අතර ඒ සඳහා මාසිකව එක් රියදුරෙකු වෙනුවෙන් රු 2000.00 ක මුදලක් ගෙවිය යුතුය. එසේම බදුල්ලෙන් පිටත රාත්‍රී ගමන් වාර සඳහා පැයකට ගෙවන මුදල පමණක් විශ්වවිද්‍යාලය මඟින් ගෙවනු ලැබේ

10. වාහන නඩත්තු **(Service)** කටයුතුද ඒ සඳහා සියලු වියදම් වාහන හිමිකරු විසින්ම සිදුකල යුතුය .වාහනය සේවා කිරීම සඳහා එක් මසක් සඳහා දිනක කාලයක් ලබා දේ. එයට අමතරව විශේෂ හේතුවක් මත වාහනය අවශ්‍ය වන්නේනම් උපකුලපති, ලේඛකාධිකාරි හෝ වාහන භාර නිලධාරිගේ ලිඛිත අවසරය මත පමණක් ඉවත් කරගත හැකිය.

11. ටෙන්ඩරය සඳහා අයදුම් කරන අවස්ථාවේදී ටෙන්ඩරය අවසන් දිනට මාස 03ක් ඇතුලත ලබාගත් ඉන්ධන කාර්යක්ෂමතාවය පිළිබඳ සහතිකයක් **(Certificate of fuel consumption)** ඉදිරිපත් කල යුතුය. මෙය වාහන ඇගයීමේදි සලකා බලනු ලැබේ.

12. ටෙන්ඩරය ලබා ගන්නා ටෙන්ඩර්කරු විසින් වාහනය ඉවත් කර ගැනීමට අදහස් කරන්නේ නම් එක් ලිත් මසක පූර්ව දැනුම් දීමක් සිදු කල යුතුය. එමෙන්ම විශ්වවිද්‍යාලයට යම් වාහනයක් කුලී පදනම මත ලබා ගැනීමට තවදුරටත් අවශ්‍ය නොවන්නේ නම් ඒ බව වාහනයේ හිමිකරු වෙත දැන්වීමෙන් අනතුරුව අදාල දැන්වීමේ දින සිට මසක කාලයක් ඇතුලත හිමිකරු විසින් විශ්විද්‍යාලයෙන් වාහනය ඉවත් කර ගත යුතුය.

13. සාර්ථක ටෙන්ඩර්කරු විසින් මාස 12ක ටෙන්ඩර් මුදලින් 5% කට සමාන වන්නා වූ මාස 13කට වලංගු කාර්ය සාධන බැදුම්කරයක් විශ්වවිද්‍යාලය වෙත ලබා දිය යුතුය. ටෙන්ඩරය දීර්ඝ කරනු ලබන්නේ නම් එම කාලයට කාර්ය සාධක බැදුම්කරයද දීර්ඝ කල යුතුය.

14. එක් ලිත් මසක පූර්ව දැනුම් දීමකින් තොරව තම වාහනය ඉවත්කර ගන්නේ නම් ඉහත කාර්ය සාධන බැදුම්කරයේ වටිනාකම විශ්වවිද්‍යාලය වෙත හිමි කර ගැනීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතු වේ.

15. වාහනය පැය 24කට වැඩි කාලයක් සඳහා ඉවත් කර ගැනීමට කටයුතු සිදු වන අවස්ථා වලදී ඒ සඳහා ඒ සමාන වෙනත් වාහනයක් ලබා දීම පිළිගත් ටෙන්ඩර්කරු විසින් සිදු කල යුතු අතර එසේ නොවන අවස්ථා වලදී අංක **08**න්

පෙන්වා ඇති පරිදි මාසික කුලියෙන් අඩු කිරීමට හා එයද ප්‍රමාණවත් නොවන අවස්ථා වලදී කාර්ය සාධක බැදුම්කරයෙන්ද නියමිත මුදල අඩු කිරීමට කටයුතු කරනු ලැබේ. ඒ සඳහා වෙනත් වාහනයක් විශ්වවිද්‍යාලය විසින් යෙදවීමට සිදු වන විට ඒ සඳහා වැය වන කුලිය ටෙන්ඩර්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කෙරේ.

16. සෑම ආසනයක් සදහාම මගී ආරක්ෂක පටි තිබිය යුතුය.

17. හිස රැදවුම් (**Head rest**) සහිත ආසන විය යුතු අතර අවශ්‍ය ආකාරයට සැකසිය හැකි (**Adjustable**) සම්මත ප්‍රමාණයේ ඒවා විය යුතුය.

18. පිළිගත් ටෙන්ඩර්කරු සෑම අවස්ථාවකම වාහනය මනා ක්‍රියාකාරීත්වයෙන් පවත්වා ගෙන යා යුතු අතර විශ්වවිද්‍යාලයීය බලධාරීන් විසින් නියම කරනු ලබන අවස්ථා වලදී වායු සමන, තිරිංග, බැටරි, නිවැරදි කිරීම් සිදු කල යුතු අතර ටයර් මාරු කිරීමද සිදු කල යුතුය. එසේම වාහනය ඇතුළත හා පිටත දෛනිකව පිරිසුදු කර පවත්වාගත යුතුය.

19. නුසුදුසු ධාවන තත්වය,රියදුරුගේ නොසැලකිල්ල හා තම රාජකාරිය නිසි ලෙස ඉටු නොකිරීම, විශ්වවිද්‍යාලයෙන් දෙනු ලබන උපදෙස් නිසි පරිදි ඉටු නොකිරීම වැනි හෝ වෙනත් ඕනෑම කරුණක් මත අදාල වාහනය හෝ රියදුරු ඕනෑම අවස්ථාවක ඉවත් කිරීමේ බලය විශ්වවිද්‍යාලය සතුවේ.

20. වාහනය සේවයේ යොදවන දිනට අදාල රියදුරුගේ නම සහ පහත ලියකියවිලි ඉදිරිපත් කල යුතු අතර එම රියදුරන් සේවයේ යෙදවිය යුතුය. එම රියදුරන් සේවයේ යෙදවීම සඳහා වාහනය අනුයුක්ත කරන අදාළ නිළධාරියාගේ අනුමැතිය ලබාගත යුතුය. රියදුරු නොමැති විට එම කාලසීමාව සඳහා අදාළ නිළධාරියා හෝ නිළධාරියාගේ අනුමැතිය යටතේ සුදුසු රියදුරෙකු සේවයේ යොදවනු ඇත.

**i** රියදුරු බලපත්‍රය
**ii** ජාතික හැඳුනුම්පත
**iii** පොලිස් වාර්තාව

21. වාහනයකට අදාලව සිදු වන්නා වූ අනතුරු සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය වග නොකියන අතර යම් අනතුරක් හේතුවෙන් වාහනයේ ගමන් ගන්නා මගීන් වෙනුවෙන් වන රක්ෂණ වන්දි ලබා දීම සඳහා ටෙන්ඩර්කරු මැදිහත් විය යුතුය. අදාල වාහනය ධාවනය කරන අවස්ථාවේදී කාර්මික දෝෂයක් හෝ අනතුරකට ලක් වූ අවස්ථාවක ටෙන්ඩර්කරු විසින් වෙනත් වාහනයක් ලබාදීම සිදුකල යුතුය.

22. පිළිගත් ටෙන්ඩර්කරු විසින් සපයන වාහනයට අදාල ධාවන සටහන් පොත් රියදුරු විසින් මනා ලෙස පවත්වාගෙන යා යුතු අතර සෑම අවස්ථාවකම වාහනය භාරව ගිය නිලධාරීන් වෙතින් අත්සන් ලබා ගත යුතුය.

23. සෑම මසක් අවසානයේදීම ධාවන සටහන් පොත සමග මාසික බිල්පත ඉදිරිපත් කල යුතුය. වාහනය භාරව ගිය නිලධාරීන් විසින් අත්සන් කර නොමැති කි.මී ගණන සඳහා ගෙවීම් සිදු කරනු නොලැබේ.ධාවන සටහන් පොත් බිල්පතත් සමග සෑම මසකම අවසන් දින සිට දින 15ක් ඇතුලත ගෙවීම් කටයුතු සඳහා යොමු කල යුතුය. එසේ නොමැති වුවහොත් ඒ සඳහා ප්‍රමාද වන සතියක් සඳහා මුලු මුදලෙන් අවම 0.05% ,උපරිම 10%ක ප්‍රතිශතයකට යටත්ව අඩු කරනු ලැබේ. තවද විශ්වවිද්‍යාලය මඟින් ගෙවීම් මාස 02 ක් ප්‍රමාද වුවද, වාහනයේ නඩත්තු වියදම් ,සේවක වැටුප් ගෙවීම නියමිත පරිදි සිදු කල යුතුය.

24. ටෙන්ඩර් මිල ගණන් ඉදිරිපත් කිරීමේදි එහි මුල් පිටපත හා අනුපිටපත් වශයෙන් වෙන වෙනම කවර වල බහා "මාසික කුලී පදනම මත වාහන සැපයීම - ටෙන්ඩර් අංක **UWU/GA/05/V/25/01** යන්න සදහන් කර ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ එය ලියාපදිංචි තැපෑලෙන් සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, බදුල්ල යන ලිපිනයට **2025.01.21** දින ප.ව 2.30 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

25. ටෙන්ඩර්පත් නියමිත දින නියමිත වේලාවට පෙර ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය වෙත ලැබීමට සැලැස්විය යුතුය. තැපෑලේදී නැතිවන හෝ නියමිත දින නියමිත වේලාවට පෙර නොලැබෙන ටෙන්ඩර් පත් සම්බන්ධව කිසිදු

වගකීමක් විශ්වවිද්‍යාලය භාර නොගන්නා අතර නියමිත වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර් මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

26. ටෙන්ඩර්පත් **2025.01.21** දින ප.ව 2.30ට විශ්වවිද්‍යාලයීය ප්‍රධාන පරිපාලන ගොඩනැගිල්ලේදී විවෘත කරනු ලබන අතර ඒ සඳහා ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැක.

27. මිල ගණන් ඉදිරිපත් කිරීමේදී පැහැදිලි අකුරෙන් සහ ඉලක්කමෙන් තම මිල ගණන් සඳහන් කල යුතු අතර යම් වෙනස් කිරීමක් සිදු කර ඇත්නම් එය අත්සන් තබා සහතික කල යුතුය.මිල ගණන් සංශෝධනයන් සඳහා නිවැරැදි කිරීමේ තීන්ත(**Tipex)** භාවිතා නොකළ යුතුයි.

28. එක් ඉල්ලුම්කරුවෙකු විසින් වාහන එකකට වඩා ඉල්ලුම් කරනු ලබන්නේ නම් එක් එක් වාහනය සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතු අතර වෙන වෙනම ඇපකර ද තැබිය යුතුය.

29. සේවා අවශ්‍යතාවය මත ටෙන්ඩර් කාල සීමාවෙන් පසු වුවද සේවා සැපයීමට සිදු විය හැක.

30. යම් මිල ගණනක් ප්‍රතික්ෂේප කිරීම පිළිගැනීම හෝ සියලු ටෙන්ඩර්පත් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයීය ප්‍රසම්පාදන කමිටුව සතු අයිතියකි.

31. පරික්ෂා කිරීම සදහා වාහන ඉදිරිපත් කරන ලෙස කරනු ලබන විශ්වවිද්‍යාලයීය ඉල්ලීම අනුව විශ්වවිද්‍යාලය වෙත අදාල වාහනය ඉදිරිපත් කළ යුතු අතර ඒ සඳහා කිසිම ගෙවීමක් විශ්වවිද්‍යාලය විසින් දරනු නොලැබේ. තවද පරික්ෂාවට ඉදිරිපත් නොකරන වාහනවල ලංසු ඇපකරය නිදහස් කරනු නොලැබේ.

32. වාහනය යම්කිසි හේතුවක් මත වෙනස්වන්නේ නම් ඒ පිළිබඳ එක් ලිත් මසක පූර්ව දැනුම් දීමක් සිදු කළ යුතුය.

33. වාහන පරික්ෂා කිරීමෙන් අනතුරුව එය විශ්වවිද්‍යාලයේ ධාවනයට යොදා ගන්නේ නම් ඉහත කොන්දේසි වලට යටත්ව ගිවිසුමකට එළඹිය යුතුය. රජයේ බදු මුදල් සම්බන්ධ ප්‍රතිපත්තීන් ගෙවීම් කිරීමේදි අනුගමනය කරනු ලැබේ.

සභාපති
ප්‍රසම්පාදන කමිටුව
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
බදුල්ල

**උඟුව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය**
**බදුල්ල**
**ටෙන්ඩර් අංකය- UWU/GA/05/V/25/01**

සභාපති
ප්‍රසම්පාදන කමිටුව
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
බදුල්ල

මාසික කුලී පදනම මත වාහන සැපයීම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම

**01.** ටෙන්ඩර්කරුගේ නම **:-** ..........................................................................................................................................

ජාතික හැඳුනුම්පත් අංකය/විදේශ ගමන් බලපත්‍ර අංක **-:** ............................................................................

ආයතනයක් නම් ව්‍යාපාර ලියාපදිංචි අංකය **:-**...............................................................................

**02.** ලිපිනය **:-** ....................................................................................................................................

.

....................................................................................................................................

**03.** දුරකථන අංකය **:-** ..........................................................................................................................

**04.** ටෙන්ඩරය සඳහා ඉදිරිපත් කරනු ලබන වාහනය **:-**..........................................................................

**05.** වාහන අංකය **:-** ..............................................................................................................................

**06.** වාහනයේ නිෂ්පාදිත වර්ෂය **:-** .......................................................................................................

**07.** වාහනය ලියාපදිංචි වර්ෂය **:-**.......................................................................................................

**08.** වාහන වර්ගය හා මෝස්තරය **:-**..................................................................................................

**09.** තක්සේරු දළ වටිනාකම(තක්සේරු වාර්තාව ඇත්නම් අමුණන්න) **:** ..................................................................

**10.** ආසන ගණන **:-** ....................................................................................................................

## 11. මිල ගණන් ඉදිරිපත් කිරීම (පළමු වසර සඳහා)

11.01 පීඨාධිපතිතුමාගේ පරිහරණය සඳහා

| වාහන වර්ගය | කි.මි 2000 ක් සදහා (ඉන්ධන නොමැතිව රු) | |
|---|---|---|
| | ඉලක්කමෙන් | අකුරෙන් |
| මෝටර් කාර් රථ සෙඩාන් හෝ SUV මාදිලිය(1490සීසී-1600සීසී/පෙට්‍රල්/වායු සමනය සහිත/ ජපන්/යුරෝපීය තාක්ෂණය හෝ සමාන) | | |

11.02

| වාහන වර්ගය | සීමාවට වඩා වැඩිවන කි.මි 01 ක් සදහා (ඉන්ධන නොමැතිව රු) | |
|---|---|---|
| | ඉලක්කමෙන් | අකුරෙන් |
| මෝටර් කාර් රථ සෙඩාන් හෝ SUV මාදිලිය (1490 සීසී-1600සීසී/ පෙට්‍රල් /වායු සමනය සහිත/ ජපන්/යුරෝපීය තාක්ෂණය හෝ සමාන) | | |

අදාල වාහනයේ රියදුරු සදහා කම්කරු නීතී රීති වලට අදාලව මාසික වේතනය :-.........................................................

## 12. මිල ගණන් ඉදිරිපත් කිරීම (දෙවන වසර සඳහා)

12.01 පීඨාධිපතිතුමාගේ පරිහරණය සඳහා

| වාහන වර්ගය | කි.මි 2000 ක් සදහා (ඉන්ධන නොමැතිව රු) | |
|---|---|---|
| | ඉලක්කමෙන් | අකුරෙන් |
| මෝටර් කාර් රථ සෙඩාන් හෝ SUV මාදිලිය (1490 සීසී-1600සීසී/පෙට්‍රල්/වායු සමනය සහිත/ ජපන්/යුරෝපීය තාක්ෂණය හෝ සමාන | | |

12.02

| වාහන වර්ගය | සීමාවට වඩා වැඩිවන කි.මී 01 ක් සඳහා (ඉන්ධන නොමැතිව රු) | |
|---|---|---|
| | ඉලක්කමෙන් | අකුරෙන් |
| මෝටර් කාර් රථ සෙඩාන් හෝ SUV මාදිලිය (1490 සීසී-1600සීසී/ පෙට්‍රල් /වායු සමනය සහිත/ ජපන්/යුරෝපීය තාක්ෂණය හෝ සමාන | | |

අදාල වාහනයේ රියදුරු සඳහා කම්කරු නීතී රීති වලට අදාලව මාසික වේතනය :-.......................................................

13.. **මිල ගණන් ඉදිරිපත් කිරීම** (**තෙවන වසර සඳහා)**

12.01 ජ්‍යෙෂ්ඨාධිපතිතුමාගේ පරිහරණය සඳහා

| වාහන වර්ගය | කි.මී 2000 ක් සඳහා (ඉන්ධන නොමැතිව රු.) | |
|---|---|---|
| | ඉලක්කමෙන් | අකුරෙන් |
| මෝටර් කාර් රථ සෙඩාන් හෝ SUV මාදිලිය (1490 සීසී-1600සීසී/පෙට්‍රල් / ජපන්/යුරෝපීය තාක්ෂණය හෝ සමාන/වායු සමනය සහිත/ජපන්/යුරෝපීය තාක්ෂණය හෝ සමාන | | |

12.02

| වාහන වර්ගය | සීමාවට වඩා වැඩිවන කි.මී 01 ක් සඳහා (ඉන්ධන නොමැතිව රු) | |
|---|---|---|
| | ඉලක්කමෙන් | අකුරෙන් |
| මෝටර් කාර් රථ සෙඩාන් හෝ SUV මාදිලිය (1490 සීසී-1600සීසී/ පෙට්‍රල් /වායු සමනය සහිත / ජපන්/යුරෝපීය තාක්ෂණය හෝ සමාන | | |

අදාල වාහනයේ රියදුරු සඳහා කම්කරු නීතී රීති වලට අදාලව මාසික වේතනය :-.......................................................

**පහත සඳහන් තත්වයන් ඔබගේ මෝටර් රථයේ පවතී ද යන්න තහවුරු කරන්න.**

01. **Fuel only / Electric / Hybrid / Plugin Hybrid**

| | | |
|---|---|---|
| | | **ඇත (√ ) හෝ නැත (x)** |
| **02.** | **Auto Gear** | |
| **03.** | **Parking Sensor** | |
| **04.** | **Radar Sensor** | |
| **05.** | **Dashboard Camera** | |
| **06.** | **Power Mirrors** | |
| **07.** | **Higher Cargo Space** | |
| **08.** | **High Rear Leg Space** | |
| **09.** | **Comfortable Cabin** | |

ඉදිරිපත් කරන ඉහත මිල ගණන් විවෘත කරන දින සිට දින 90ක් දක්වා වලංගු බවත් ටෙන්ඩර් කොන්දේසි යටතේ දක්වා ඇති පරිදි වාහනය ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් / නාමමාත්‍ර ඉන්වොයිසිය මෙයට අමුණා ඇති අතර ටෙන්ඩර් කොන්දේසි හොඳින් කියවා බලා මෙම මිල ගණන් ඉදිරිපත් කරනු ලබන බවත් සඳහන් කරමි.

.........................................................

ටෙන්ඩර්කරුගේ අත්සන

.......................................

දිනය